

# ශ්‍රී ලාංකික ජනතාවගේ සහ දේශයේ සෞභාග්‍ය වෙනුවෙන් කැප වී සිටින අප සමග හවුල්කරුවකු වන්නට ඔබත් කැමතිද?

දිවයින පුරා ශාඛා 276 කින් යුත් ශාඛා ජාලයකින් සහ 3000 කට වැඩි ශ්‍රම බලකායකින් යුත් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම රාජ්‍ය සංවර්ධන බැංකුව වන ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ පුරප්පාඩුව ඇති පහත තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද ඇති ප්‍රතිඵල අභිමුඛ නිර්මාණශීලී පුද්ගලයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## මාධ්‍ය නිර්මාණ ශිල්පී (MEDIA DEVELOPER) :

### රැකියා කාර්ය භාරය

- ශ්‍රව්‍ය / දෘශ්‍ය/ ග්‍රැෆික් සහ සජීවිකරණ සංස්කරණය
- ශ්‍රව්‍ය / දෘශ්‍ය/ ග්‍රැෆික් සහ සජීවිකරණ ආශ්‍රිත නිර්මාණ කටයුතු
- ශ්‍රව්‍ය / දෘශ්‍ය/ ශබ්ද සංකලනය
- බැංකු අලෙවිකරණ අවශ්‍යතා පාදක කරගත් නව නිර්මාණකරණය
- බැංකුවෙහි මාධ්‍ය සංස්කරණය සම්බන්ධ අනෙකුත් ක්‍රියාකාරකම්

### මූලික සුදුසුකම් :

1. පිළිගත් ආයතනයකින් ශ්‍රව්‍ය/ දෘශ්‍ය/ සංස්කරණය පිළිබඳ (වසර 1 කට නොඅඩු) ඩිප්ලෝමාවක් ලබාතිබීම.
2. අ.පො.ස. සා/ පෙළ විභාගයේදී ගණිතය, ඉංග්‍රීසි සහ සිංහල විෂයයන් ඇතුළුව සම්මාන 5 ක් සහිතව විෂයයන් 06 ක් එකවර සමත්ව තිබීම.
3. අ.පො.ස. උ/ පෙළ විභාගය එක්වරකදී විෂයයන් 03 කින් සමත් වී තිබීම.
4. නිර්මාණශීලී/ ශ්‍රව්‍ය/ දෘශ්‍ය/ ග්‍රැෆික් සහ සජීවිකරණය පිළිබඳ වසර 10 ක පළපුරුද්ද.
5. මනා සන්නිවේදන සහ අන්තර් පුද්ගල කුසලතා සහිත අයෙකු වීම.

### වයස

වයස අවු. 40 ට අඩු විය යුතුය.

### අයදුම්පත් භාරගන්නා අවසන් දිනය

2021 ජූලි 18

### අයදුම් කරන පිළිවෙල :

මෙම තනතුර සම්බන්ධව උනන්දුවක් දක්වන සුදුසුකම්ලත් අයදුම්කරුවන් විසින් අධ්‍යාපනික වෘත්තීමය සහතිකපත්වල පිටපත් සහිතව ජීව දත්ත තොරතුරු ඇතුළත් අයදුම්පතක් ඉදිරිපත් කළ යුතුය.එම අයදුම්පතෙහි නම, ලිපිනය, දුරකතන අංකය සහිතව ඥාතීන් නොවන වෘත්තීමය පුද්ගලයින් දෙදෙනෙකුගේ තොරතුරු ද ඇතුළත් කර එවිය යුතු අතර. තැපැලෙන් යොමු කරන්නේ නම් අයදුම්කරන තනතුර අයදුම්පත්‍රය බහා එවන ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය. නැතහොත් එම අයදුම්පත් careers@rdb.lk යන ඊමේල් ලිපිනයට යොමු කළ යුතුය. අයදුම්කරනු ලබන තනතුර, ඊමේල් පණිවුඩයේ ශීර්ෂයෙහි සඳහන් කර එවිය යුතුය.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
பிரதேச அபிவிருத்தி வங்கி
RDB Regional Development Bank

ප්‍රධාන මානව සම්පත් නිලධාරී,
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව,
අංක 933, නුවර පාර, වෙදමුල්ල, කැලණිය.
0112 42 52 62 | www.rdb.lk